ශ්‍රී සුමංගල විද්‍යාලය - පානදුර

Sri Sumangala College - Panadura

ප්‍රථම වාර පරීක්ෂණය - 2020 මාර්තු

1st Term Test - March 2020

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය Grade 07 | විෂයය Subject සිංහල | පත්‍රය Paper I,II | කාලය Time පැය 02 |

නම :- ........................................................................................ පංතිය :- ............................

සැලකිය යුතුයි **:-**

- **පළමු කොටසේ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**

**I කොටස**

---

- පහත සඳහන් ප්‍රශ්නවල ඉරි ඇඳි කොටසේ අර්ථය තෝරා යටින් ඉරක් අඳින්න.

01. තව දුරටත් රට තුළ **කැලෑ නීතිය** ක්‍රියාත්මක වුවහොත් මහජනයා උද්ඝෝෂණ නංවනු ඇතැ'යි ඇතැමෙක් කීහ.

1. කැලයට ගොස් මරා දැමීම.
2. ධනවතුන් රජ කරවීම.
3. කැලෑ පත්තර ගැසීම.
4. බලවතා දුබලයා පෙලීම.

02. ඔහුගේ හදිසි තීරණය ඇසූ ඈ **අන්දමන්ද ව** බලා සිටියාය.

1. අන්ධභාවයට පැමිණ
2. බය වීමෙන්
3. උමතුවෙන් මෙන්
4. කර කියාගත හැකි කිසිවක් නැතිව

- 03 සහ 04 ප්‍රශ්නවල දි ඇති වචන අතරින් සෑම පදයක ම නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පද පේළිය තෝරන්න.

03.
1. ධර්මිෂ්ඨ,ආහාශය
2. ධර්මිෂ්ඨ, ආභාසය
3. ද්‍ර්මිෂ්ට,ආබාසය
4. ද්‍ර්මිෂ්ට, ආභාශය

04.
1. දර්ශන,පිළිවෙළ
2. දර්ශන, පිළිවෙල
3. දර්ෂණ,පිළිවෙළ
4. දර්සන,පිළිවෙළ

- පහත ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

05.මෙහි දැක්වෙන ඇමතිතුමා,සහෝදරියක,සිංහයෙකු යන අනුක්ත පදවල උක්ත රූපය නිවැරදි ව පිළිවෙළින් දැක්වෙන පිළිතුර වන්නේ,

1. ඇමතිතුමන්,සහෝදරියක්,සිංහයෙක් 2. ඇමතිතුමා,සහෝදරියක්,සිංහයෙක්

3. ඇමතිතුමා,සහෝදරියන්,සිංහයෝ 4. ඇමතිතුමා,සහෝදරියක්,සිංහයෝ

06. අවතල,නම්බුව.උත්තර යන වචනවලට ගැළපෙන විරුද්ධාර්ථ පද පිළිවෙළින් දැක්වෙන පිළිතුර වන්නේ,

1. උත්තල,නිරුත්තර,අවනම්බුව 2. නිරුත්තර,අවනම්බුව,උත්තල

3. උත්තල,අවනම්බුව,පත්තර 4. උත්තල,අවනම්බුව,නිරුත්තර

07. අඹර,ශාක්‍යසිංහ,මිගරාජ,දිනිති යන පදවලට ගැළපෙන සමානාර්ථ පද පිළිවෙළින් දැක්වෙන පිළිතුර වන්නේ,

1. ගුවන,බුදුරජ,නරියා,මාතෘ 2. අහස,බුදුරජ,සිංහයා,මැණි

2. බුදුරජ,නරියා,මාතෘ,ගුවන 4. අහස,බුදුරජ,මැණි,සිංහයා

08. සිංහල භාෂාවේ උත්තම පුරුෂ,මධ්‍යම පුරුෂ, ප්‍රථම පුරුෂ ඒක වචන නාමපද නිවැරදි ව පිළිවෙළට දැක්වෙන පිළිතුර වන්නේ,

1. මට,යුෂ්මතා,අම්මා 2. අපි,තොපි,ඔවුහු

3. මම,නුඹලා,ළමයි 4. අපි,තෝ,ඇය

09.සිදත් සඟරා හෝඩියේ නොමැති වුවත් වර්තමානයේ භාවිත සිංහල හෝඩියේ ඇතුළත් අක්ෂර වර්ගයක් වන්නේ.

1. ස්වර අක්ෂර 2. මහාප්‍රාණ අක්ෂර

2. ව්‍යංජන අක්ෂර 4. අල්පප්‍රාණ අක්ෂර

10. සිදත් සගරා හෝඩියේ ඇති ස්වර අක්ෂර දහයට අයත් අක්ෂර පමණක් දැක්වෙන පිළිතුර වන්නේ,

1. අ,ඉ,ග,ළ 2. ඒ,ඕ,ඌ,ජ

3. ප,ඔ,ආ,එ 4. ක,අං,එ,ඉ

11. වී ගොවිතැන ආශ්‍රිත ව සැදුණු බස් වහරේ දී රතුබෝය,ලියන්නාව.කිරි කබළු,අම්බරුවන්,යන වචන සාමාන්‍ය වහරේ දී හඳුන්වන්නේ,

1. කෝපි, යකඩ කැබැල්ල, කිරිබත්, මී හරක් ලෙසය. 2. තේ කහට දැකැත්ත,ආප්ප,මීහරක් ලෙසය.

3. තේ කහට දැකැත්ත,කිරිබත්,මීහරක් ලෙසය. 4. කෝපි, කළය, ආප්ප, මීහරක් ලෙසය.

12. අහිකුණ්ඨික ජනයා අතර භාවිත වන වංගෙඩිය .බේසම,කෑම පිසින වළඳ,ඇඹරුම් ගල යන උපකරණ සඳහා ඔවුන් භාවිත කරන නාමයන් පිළිවෙළින් දැක්වෙන පිළිතුර වන්නේ,

1. ඉරමන්,පාලෙ,හඳව,රෝලු 2. මස්කන්,රෝලු,පස්රායි,කුණ්ඩ

3. රෝලු,කුණ්ඩ,පස්රායි,පාලෙ 4. රෝලු,පාලෙ,කුණ්ඩ,පස්රායි

13. පහත වාක්‍යයේ ඉරි ඇඳි පදවලට ගැළපෙන ක්‍රියා වර්ගය නිවැරදිව දැක්වෙන පිළිතුර වන්නේ,

- ළමයි වතුරට පැන සෙල්ලම් කරමින් ගී ගැයුවෝය.

1. පූර්ව ක්‍රියා,අවසාන ක්‍රියා,මිශ්‍ර ක්‍රියා
2. මිශ්‍රක්‍රියා, අවසාන ක්‍රියා.පූර්ව ක්‍රියා
3. පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අවසාන ක්‍රියා
4. මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා, අවසාන ක්‍රියා

14. මීයා,කවුඩු.රජ,අලියා යන පුරුෂ ලිංග පදවලට ගැලපෙන ස්ත්‍රී ලිංග පද නිවැරදිව පිළිවෙළින් දැක්වෙන පිළිතුර වන්නේ,

1. මීවිච්,කැවිඩි,රැජින,කෙනර
2. මීවිච්,කවුඩු දෙන, රැජින,ඇතින්න
3. කැවිඩි.මීවිච්,ඇතින්න,රැජින
4. කැවිඩි,මීවිච්,රැජින,ඇතින්න

15. සරණංකර සංඝරාජ තෙරණුවන් විසින් රචිත ශාස්ත්‍රීය ග්‍රන්ථයක් නොවන්නේ,

1. මුනිගුණ අලංකාරය
2. බුදුගුණ අලංකාරය
3. සාරාර්ථ සංග්‍රහය
4. මහා බෝධිවංශ සන්නය

- හිස්තැනට සුදුසු පද වරහන් තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.

16. තාරකාව අහසේ.............................................. ( බබළයි / බබළති )

17. නුඹලා පොත්පත්............................................ ( බැලුවෙහි / බැලුවෙහු )

18. මිනිස්සු වෙහෙස වී පාරේ වැඩ........................ ( කරති / කරයි )

- පහත දැක්වෙන ප්‍රස්තාව පිරුළු සම්පූර්ණ කරන්න.

19. කුනිස්සන්ට...................................................................................................

20. අතිසාරයට...................................................................................................

( ලකුණු 2x20=40 )

## ii කොටස

- **පළමුවන ප්‍රශ්නය, දෙවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.**

---

01. සිංහල විෂය සඳහා ඔබ නිර්මාණය කළ පොත් පිංචක් ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| | | |
|---|---|---|
| I. | පොත් පිංච සකස් කළේ කුමන මාතෘකාවක් ගැනද? | (ලකුණු 02) |
| II. | ඔබ ඒ සඳහා යොදාගත් සම්පත් මොනවාද? | (ලකුණු 02) |
| III. | එය නිර්මාණය සඳහා ඔබට උපදෙස් සැපයූ තිදෙනෙක් නම් කරන්න. | (ලකුණු 04) |
| IV. | මෙම ක්‍රියාකාරකම කරගෙන යාමේ දී ඔබ මුහුණ දුන් ගැටලු 02ක් නම් කරන්න. | (ලකුණු 04) |
| V. | මෙම ක්‍රියාකාරකමෙහි නිරත වීමෙන් බවට ලැබුණු ප්‍රයෝජන 02ක් ලියන්න. | (ලකුණු 04) |

(මුළු ලකුණු 16)

02. පහත සඳහන් වාක්‍යවලින් එකක් තෝරාගෙන වචන 150කට නොඅඩු වන සේ රචනයක් ලියන්න.

1. සුමිතුරු පරිසරය සුරකිමු නිරතුරු
2. පොතපත කියවමු දැනුම වඩවා ගමු.
3. වැඩිහිටියන් රැකබලා ගනිමු
4. පිනබර මාගේ ජන්ම භූමිය
5. ලංකාවේ අභිකුණ්ඨික ජනතාව

(ලකුණු 14 )

03. පහත සඳහන් ප්‍රකාශය ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

"හොඳයි. මම මින් ගැලවෙන විදියක් කියන්නම්"

1. මේ ප්‍රකාශය කළේ කා විසින් කා හටද?
2. මෙම ප්‍රකාශය ඇතුළත් පාඩමේ නම කුමක්ද?
3. මෙම කතාව උපුටා ගත් කෘතිය නම් කරන්න.
4. මේ කතාවේ දී ඔබට හමුවන සත්ත්ව චරිත 02ක් ලියන්න.
5. ඉහත ප්‍රකාශයේ "ගැලවෙන විදියක්" යනුවෙන් අදහස් වන්නේ කුමක් ද?

(ලකුණු 2 x 5 = 10 )

04. ඔබ පාසලේ පැවති ත්‍යාග ප්‍රදානෝත්සවය පිළිබඳ විස්තර කියමින් ඔබගේ හොඳම මිතුරාට / මිතුරියට යවන ලිපිය ලියන්න. ( ලකුණු 10 )

05. වෙසක් උත්සවය වෙනුවෙන් සූදානම් කරන දන්සලක් පිළිබඳ ව විස්තර කතා කරන ඔබ හා පන්සලේ ස්වාමීන් වහන්සේ සමඟ කෙරෙන කෙටි සංවාදයක් ගොඩනගන්න. (ලකුණු 10 )

06. දී ඇති කවි සම්පූර්ණ කරන්න.

I. මේ කොතනින් ගෙනා ගොනා
........................................
........................................
..........................................

II. කෑලිය කොළ බැන්ද මටා
මදු කොළ බැන්දේ කුමටා
...........................................
............................................

( ලකුණු 10 )

07. පහත සඳහන් ඡේදය ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

ලන්ඩන් විශ්ව විද්‍යාලයේ ඉගෙනුම ලැබූ අවධියේ බ්‍රිතාන්‍ය කෞතුකාගාරයෙහි තිබූ ශ්‍රී ලංකාවේ පුර්තුගීසි ලන්දේසි යුගවලට අයත් දුර්ලභ කෘති හැදෑරීමට අවස්ථාව ලබා ගත් එතුමා ශ්‍රී ලංකාවේ ඉතිහාසයක් සංස්කෘතියක් ඉස්මතු කරමින් එරට තුළ වූ සඟරා වලට ලිපි සපයමින් දෙස් විදෙස් උගතුන්ගේ අවධානය ඒ කෙරෙහි යොමු කිරීමට උත්සහ ගත්තේ ය. බ්‍රිතාන්‍ය කෘතුකාගාරයේ තිබී එතෙක් කිසිවකුගේ අවධානයට ලක් නොවූ මහනුවර යුගයට අයත් මගලකුණ නම් අප්‍රකට කාව්‍ය ග්‍රන්ථයක අත් පිටපතක් ලැබී එය සංස්කරණය කොට ඉදිරිපත් කිරීමෙන් විද්වතුන්ගේ මහත් පැසසුමට ලක්විය. කිතු දහම, සාහිත්‍ය ඉතිහාසය මුල් කරගෙන එතුමා විසින් රචිත ග්‍රන්ථ රාශියකි. සිංහල ක්‍රිස්තියානි සාහිත්‍ය වංශය, සිරිලක මරිය බැතිය, මහනුවර ගිවිසුම, ලක් ඉතිහාසයේ මූලික ග්‍රන්ථ හා ඔලන්ද සමය ඉන් ග්‍රන්ථ කිහිපයකි. එතුමාගෙන් සිංහල

සාහිත්‍යයට සිදු වූ විශිෂ්ට සේවයට උපහාරයක් ලෙස කැලණිය විශ්ව විද්‍යාලය 1979 වර්ෂයේ දී එතුමාට සාහිත්‍ය චක්‍රවර්ති සම්මාන උපාධිය පිරිනැමුවේය.

1. මෙම ඡේදයෙන් කියවෙන පුද්ගලයාගේ නම කුමක්ද?
2. එතුමා විසින් රචිත ග්‍රන්ථ 02ක් නම් කරන්න.
3. මෙම ඡේදයේ සඳහන් අප්‍රකට කාව්‍ය ග්‍රන්ථය කුමක්ද?
4. එතුමාගේ සේවයට උපහාර පිණිස ලද සම්මාන උපාධිය කුමක්ද?
5. විද්වතුන්ගේ පැසසුමට ලක් වීම උදෙසා එතුමා කළේ කුමක්ද?

(ලකුණු 2 x 5 = 10 )